මුට්ටි මංගල්‍යයේ අතීතය හා වර්තමානය පිළිබඳ සංසන්දනාත්මක අධ්‍යයනයක්

(ආණමඩුව ප්‍රදේශයේ වඩත්ත වැව් ගම්මානය ඇසුරින්)

පී.ඒ.ජී.කේ.එච්.කුලරත්න[1], ඒ.එච්.එම්.සී.ඩී. අබේරත්න[2]

[1]පුරාවිද්‍යා හා උරුම කළමණාකරණ අධ්‍යනාංශය, රජරට විශ්වවිද්‍යාලය
kularathne00@gmail.com
[2]පරිසර කළමනාකරණ අධ්‍යනාංශය, රජරට විශ්වවිද්‍යාලය
chathurikadilhaniaberathna@gmail.com

ප්‍රමුඛ පදඃ මුට්ටි මංගල්‍යය, සමාජය, සිරිත්විරිත්, පරපුර

හැඳින්වීම

සිංහල ජන ජීවිතය හා බද්ධ වූ සිරිත්විරිත් හා ඇදහිලි ක්‍රම අභිචාර ක්‍රම ලෙස දැක්විය හැකි ය. වැවත් ගමත් ගොවිතැනත් ආරක්ෂා කිරීම සඳහා සිදු කරන මූලික අභිචාර ක්‍රමයක් වන මුට්ටි මංගල්‍යයේ අතීත තත්ත්වය හා එයට උරුමව ඇති වර්තමාන තත්ත්වය පිළිබඳ ව සාකච්ඡා කිරීම මෙහි දී බලාපොරොත්තු වේ. වැව් ගම්මානවල මිනිසුන් තමන් නෙලා ලන්නා ලද අස්වැන්නෙන් පළමු කොටස වෙන් කළේ දෙවියන් උදෙසායි. පුත්තලම දිසුත්‍රික්කයේ ආනමඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් වඩත්ත වැව් ගම්මානය මෙහි දී අධ්‍යයන ප්‍රදේශය වේ. ගොවිගම කුලයේ මිනිසුන් වැඩි ප්‍රමාණයක් වාසය කරන මෙහි මිනිසුන් වැඩි ප්‍රමාණයකගේ ප්‍රධාන ජීවනෝපාය මාර්ගය වන්නේ ගොවිතැනයි. මෙම මංගල්‍යය නොකඩවා වසරකට වරක් පැවැත්වීම සිදු කරයි. නමුත් වසර කිහිපයක් නිසි පරිදි වර්ෂාව නොලැබීම හේතුවෙන් මෙය යම් දුරකට කඩ වීම ද සිදු වී ඇත.

අරමුණ

මුට්ටි මංගල්‍යය බැඳී පැවතුණේ වාරි සමාජය තුළයි. එවක සමාජය තුළ මෙහි සියලු චාරිත්‍ර අත්නොහැර කටයුතු සිදු කර ඇති බව මෙම ගම්මානයේ පැරැණනන් සඳහන් කරයි. අතීතයේ එසේ වුවත් මුට්ටි මංගල්‍යය හා සබැඳි මිනිස් ආකල්ප හා සිරිත්විරිත් වර්තමාන ජන ජීවිතය තුළින් ගිලිහී යාමට ලක්ව ඇති බව පැහැදිළි කිරීම මෙහි මූලික අරමුණ වේ.

ක්‍රමවේදය

පර්යේෂණ ක්‍රමවේදය ලෙස ද්විතියික දත්ත රැස් කිරීම මෙන්ම ප්‍රාථමික දත්ත රැස් කිරීමේ ක්‍රමය භාවිත කරන ලදි. මේ හා බැඳුණු වැඩි තොරතුරු ප්‍රමාණයක් ලබා ගැනීමට හැකියාව ඇත්තේ ඒ හා සම්බන්ධව කටයුතු කළ පැරණි පුද්ගලයින්ගෙනි. එම සංස්කෘතිය ඔවුන්ගේ ජන ජීවිතය හා බද්ධ වී තිබූ නිසාවෙනි. අනෙක් අතට මෙය පැරණි වාරි සමාජය නිරූපණය කරන එක් පැතිකඩක් වශයෙන් දැක්විය හැකි ය.

ප්‍රතිඵල හා සාකච්ඡාව

මුට්ටි මංගල්‍යය බැඳී පැවතුනේ වාරි සංස්කෘතිය ක්‍රියාත්මක වූ සමාජය තුළ ය. ගැමියා තමන්ගේ ජීවිතය සඳහා උපකාර

කරන වැවත් ජීවත් වන ගමත් ජීවනෝපාය වන ගොවිතැනත් ආරක්ෂා කිරීම සඳහා මෙම අභිචාර ක්‍රමය සිදු කළ අතර එයින් තමන්ගේ ජීවිතය පවා ආරක්ෂා වන බව ඔවුන් විශ්වාස කරන ලදි. මේ හා සම්බන්ධ චාරිත්‍ර ක්‍රමානුකූලව ඉටු නොකිරීමෙන් අදෘශ්‍යමාන බලවේග විසින් තමන්ගේ ජීවිතයට හා කෘෂිකර්මාන්තයට බලපෑම් කරන බව පැරණි ගැමියන් ප්‍රකාශ කරනුයේ තම වැඩිහිටි පරම්පරාව ලත් අත්දැකීම් තුළිනි. එම බාහිර බලවේග තුළින් ඇතිවන බලපෑම බොහෝ ප්‍රබල වබ අදටත් මෙම ප්‍රදේශයේ වෙසෙනෙ පැරණි ගැමියන් විශ්වාස කරයි. පැරණි සමාජය තුළ මෙම චාරිත්‍ර සියල්ලම පිළිවෙලින් සිදු කළේ සියල්ලන්ගේම යහපත උදෙසායි. ඒ සඳහා නිවැරදි පේ වීමක් අවශ්‍ය වේ. මේ සඳහා මූලික වශයෙන් දිනයක් වෙන් කරනු ලබයි. මෙහි දී ගමරාලගේ මූලිකත්වයෙන් වැඩිහිටියන් හා එක්ව දිනයක් තෝරා ගන්නා ලද අතර එම දිනය අනිවාර්යයෙන් කෙම්මුර දිනයක් වේ. ඒ සඳහා සෙනසුරාදා කෙම්මුර දවසක් ලෙස යොදා ගනියි. ඉන් පසුව මෙහි චාරිත්‍ර ආරම්භ කිරීම සිදුකරනු ලැබේ. චාරිත්‍රවලින් කොටසක් සෙනසුරාදා දින සිදු කරන අතර ඉතිරි කොටස ඉරිදා දින සිදුකරයි. මෙම කටයුතු සියල්ල සඳහා සහභාගී වන්නේ පිරිමි පාර්ශවය පමණි. ඒ සඳහා ඔවුන් දින ගණනක් පේ වී මෙම කාර්යයන් සඳහා දායක වෙයි.

මංගල්‍ය සඳහා අවශ්‍ය සහල්, පොල්, කැවුම්, පළතුරු, මුදල්, එකතු කර ඒවා කපු මහතාගේ නිවසට රැගෙන යයි. මෙම ද්‍රව්‍ය සුදු රෙද්දක ඔතා ශබ්ද වාදන මධ්‍යයේ උඩු වියන් යටින් කපුරාල මහතාගේ නිවසේ සිට මුරුකන් කද කරේ තබාගෙන වැව් සංහිදට යයි. ඉන් අනතුරුව ඇති සියලු කාර්යයන් සිදු කරන්නේ වැව් සංහිද මත සිටයි.

මේ තුළින් එදා ජනයා හා අද ජනයා ජලයට, වර්ෂාවට, ජලය රැස්කර තබා ගන්නා වැවට කෙතරම් භක්තියක් දක්වන්නේ ද යන්න තහවුරු කරගත හැකි ය. මේ මංගල්‍යයට ගමේ සියලු දෙනා සහභාගි විය යුතුය. යමෙක් මෙය හිතාමතා මගහරියි නම් ඔහුට දෙවියන්ගේ ආරක්ෂාව නැතිවී යන බව ඔවුන් විශ්වාස කරයි. කෙසේ වෙතත් අතීතයේ මෙම මංගල්‍යයේ දක්නට ලැබුණු තත්ත්වයන් වර්තමානය වනවිට සමාජයෙන් ඉවත් වී යමින් පවතී.

මෙම අභිචාර විධි වත්මන් සමාජයෙන් වෙන් වී යාමට බලපා ඇති කරුණු කිහිපයකි. අතීතයේ ගමේ පැරැණ්නන්ට තිබුණු ගෞරවය නව පරම්පරාව තුළ දක්නට නොමැති වීම. වත්මන් පරපුර වැඩිහිටියන්ගෙන් දැනමුතුකම් ගැනීමට මැලිකමක් දක්වන බව වැඩිහිටියන් පවසන ලදි. නව පරපුර මෙම අභිචාර විශ්වාස නොකරයි. ඒ නිසා ඔවුන් මේවාට මෙම සම්ප්‍රදායන්ට ගරු නොකිරීම තුළ සම්බන්ධ වීම අඩු මට්ටමක පවතී. එමෙන්ම අතීතයේ ශබ්ද පූජාව බෙර ශබ්ද හා වෙඩිමුර මෙන් ම පෙරහැර ද පැවතුනි. නමුත් වර්තමාන සමාජය තුළ දී මෙම බෙර වාදනය කළ ජනතාව එම කාර්යයට මැලිකමක් දක්වන බව මතය වී ඇත. එයට හේතුව වී ඇත්තේ කුලය යන පදනමයි. එම කුලයට අයත් පැරණි ජනතාව මෙම කාර්යය සඳහා දායක වුවත් එම පරපුරට අයත් නව පරපුර මෙම කාර්යය කිරීමට අකමැති වීමයි. කුල භේදය මෙහි දී මතුවන මූලික හේතුවක් වී ඇත. අතීතයේ තුවක්කු භාවිත කිරීම සමාජය තුළ තිබුණත් වර්තමානයේ ඒ සඳහා අවසර නැත. මේ කරුණු නිසා ශබ්ද පූජාව වැනි චාරිත්‍ර වියැකී යයි.

චාරිත්‍ර අඩු වීම සඳහා ආර්ථිකය ද සෘජුවම බලපෑම් කිරීම. පැරණි ජනතාව ගොවිතැන් කටයුතු සිදු කරන ලද්දේ

ආර්ථිකය මූලික අරමුණ කරගෙන නොවේ. නමුත් පසුගිය කාලයේ දී ගොවි ජනපද ව්‍යාපෘතිය පැමිණීම තුළ මිනිසුන් කෘෂිකර්මාන්තය සිදු කරන්නේ ආර්ථික වාසි මූලික කරගෙනයි. ඒ නිසා ඔවුන් චාරිත්‍රවාරිත්‍රවලට වඩා අස්වැන්න ආරක්ෂා කර ගැනීම සඳහා කෘමිනාශක භාවිතා කරයි.

අතීත මිනිසා මුළු හදවතින්ම මේ සිරිත්විරිත් සමඟ බැඳී කටයුතු කළත් විද්‍යාව හා තාක්ෂණය දියුණුව සමඟ වර්තමාන පරපුර මෙම සිරිත්විරිත් ප්‍රශ්නවලට ලක් කරමින් සිටී.එසේ ම කාලය සමඟ මිනිසා කාර්යය බහුල වීම. අතීත සමාජයට වඩා වර්තමාන සමාජය සංකීර්ණ වීම තුළ යම් පිරිසක් හෝ මේ පිළිබඳව භක්තියාදරයක් පැවතුණත් ඒ සඳහා සම්බන්ධ වීමට කාලයක් නොමැති වීම. පාරම්පරික තනතුරු හිස්වීම තුළ නව පරපුර මෙම තනතුරු භාර ගැනීමට අකමැති වීම.

අඛණ්ඩව වසරකට වරක් කරගෙන ආ මෙම මංගල්‍යය ස්වාභාවික පාරිසරයේ බලපෑම් මත මඟ හැරී යාම හේතුවෙන් චාරිත්‍ර අතහැරී යාම සිදු වී ඇත.

ඉහත දක්වන ලද කරුණු විමසා බැලීමෙන් අනතුරුව අතීතයේ දක්නට ලැබුණු මුට්ටි මංගල්‍යය වර්තමානය වන විට ක්‍රමයෙන් මඟ හැරී යන තත්ත්වයකට පත් වී ඇති බව තහවුරු කළ හැකියි.

ආශ්‍රිත ග්‍රන්ථ

දළුපොත, මහින්ද කුමාර. (2003)***මුට්ටි මංගල්‍යයේ වගතුග***. කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

දළුපොත, මහින්ද කුමාර. (2005)***වැව හා සංස්කෘතිය***. කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.